# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.02. 03

**නියාමන උපදෙස් - බැ/නි/ඒ/2021/02**

සියලුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ

සංගම්වල ගරු සභාපතිවරුන් වෙත,

**ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් විසින් තම සාමාජිකයන්ට ණය පහසුකම් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත මූල්‍ය නොවන සේවාවන් සම්පාදනය කිරීම**

**Credit Plus Services – CPS**

01. ග්‍රාමීය බැංකු ඇතුළු මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම් තම සාමාජික ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ විවිධ අවශ්‍යතා සඳහා ණය මුදල් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ප්‍රමුඛතාවක් දක්වනුයේ ණය වාරික හා පොළිය අයකර ගැනීමට හා අක්‍රමික ණයකරුවන් සඳහා නෛතික ක්‍රියාමාර්ගයන් තුලින් ඒවා අයකර ගැනීම සඳහා ය.

02. වර්තමානයේ දී මූල්‍ය සේවා ව්‍යාපාරය දැඩි තරඟකාරීත්වයකට මුහුණ දී ඇති හෙයින් තම සමිතිවලින් ණය ලබාගත් ගනුදෙනුකරුවන් තම සමිති වෙත දිගටම රඳවා තබා ගැනීමට (Retention of Customers) දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු වී ඇත. සමාන මූල්‍ය සේවාවන් සම්පාදනය කරන බලපත්‍රලාභී බැංකු, මූල්‍ය සමාගම් වැනි තරඟකරුවන් විවිධ අළෙවිකරණ උපක්‍රමයන් භාවිතා කරමින් සමුපකාර අංශයේ ගනුදෙනුකරුවන් ඔවුන් වෙත ලබා ගැනීමට ක්‍රියා කරන හෙයින් සමුපකාර සමිතිවලට සිය වෙළෙඳපොල කොටස ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය.

03. ගනුදෙනුකරුවන් දිගටම තම සමිති වෙත රඳවා තබා ගැනීමට වර්තමානයේ දී බොහෝ මූල්‍ය ආයතන හරස් අළෙවිකරණය (Cross Marketing) සහ ණය එකතු සේවාවන් (Credit Plus Services) සම්පාදනය කරනු ලැබේ.

04. සමුපකාර සමිතියක් විසින් තම ණයලාභීන්ට ප්‍රදානිත ණය මුදල්වලට අමතරව අනෙකුත් මූල්‍ය සේවාවන් ලබාදිය හැක. නිදසුන් වශයෙන් ණයලාභියාගේ කලත්‍රයාට ණය මුදල් ලබා දීම, දරුදැරියන්ට ඉතිරි කිරීම් ගිණුම් විවෘත කර දීම, ණයකරුගේ විවිධ මූල්‍ය අවශ්‍යතාවන්ට වරින්වර ණය පහසුකම් ලබා දී, ගනුදෙනුකරු වෙනත් මූල්‍ය ආයතනයකට මූල්‍ය අවශ්‍යතා සඳහා යාමට ඇති ඉඩකඩ වලකා ගත හැකිය.

05. ණය එකතු සේවාවන් ලෙස ගනුදෙනුකරුට පහත දැක්වෙන මූල්‍යමය නොවන සේවාවන් ලබා දී ඔහු වෙනත් තරඟකරුවන් වෙත සංක්‍රමණය වීමට ඇති ඉඩකඩ වලක්වා ගත හැකි ය.

I. ව්‍යාපාරික සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීම. (Business Planning)

II. ගිණුම්කරණය සහ ව්‍යාපාරයේ වාර්තා පවත්වාගෙන යාම. (Accounting & Recorders Keeping)

III. අර්ථසාධක අරමුදල්, සේවායෝජක භාරකාර අරමුදල් සහ වෙනත් උපයෝජිත ගෙවීම් කලට වේලාවට පියවීමේ වැදගත්කම.

IV. තම පාරිභෝගිකයන් සංතෘප්තිමත් කිරීම සඳහා මනා ගනුදෙනුකාර සබඳතා පවත්වා ගෙන යාමේ වැදගත්කම පිළිබඳව අවබෝධ කර දීම.

V. ව්‍යාපාර ලියාපදිංචි කිරීම, ආදායම් බදු කටයුතු සහ වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරවීම.

VI. තම සේවක මණ්ඩලය අභිප්‍රේරණය කර උපරිම ඵලදායිත්වය ලබා කර ගැනීම පිළිබඳව අවධානය යොමු කරවීම.

VII. ව්‍යාපාරය සහ පුද්ගලයා අධිතෝලන (Over gearing) , අධිවෙළෙඳ (Overtrading) තත්වයන්ගෙන් තොරව මනා මූල්‍ය විනයකින් යුක්තව පවත්වාගෙන යාම.

VIII. ණයලාභියා අධික පොලී අනුපාතයන්ගෙන්, ගිනිපොලීකරුවන්ගෙන් ණය ලබා ගැනීම වලක්වා ගැනීම.

IX. ආදායමෙන් සැළකිය යුතු ප්‍රමාණයක් ඉතිරි කිරීම සහ නැවත ඵලදායී ආයෝජන සිදු කිරීම සඳහා උනන්දු කරවීම.

X. විශේෂයෙන්ම කාන්තා සාමාජික ගනුදෙනුකරුවන් සඳහා පෝෂණය, ළමා සෞඛ්‍ය, ගෘහ පාලනය, ගෘහ අර්ථශාස්ත්‍රය (Home Economics), සකසුරුවම්කම (Thrift), අරපිරිමැස්ම සහ නාස්තිය අවම කර ගැනීම යනාදී විෂයන් සම්බන්ධව අවබෝධයක් ලබාදීම.

XI. කුඩා ව්‍යවසායකයන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් (Entrepreneurship Development Programs) පැවැත්වීම.

XII. පාරිභෝගික සත්කාරය, අලෙවිකරණ භාණ්ඩ හා සේවාවල උසස් අනර්ගත්වයක් පවත්වාගෙනයාම හා ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි හා යෝජනා (Customer complaints and Suggestions) කෙරෙහි සැලකිලිමත් වී අවශ්‍ය විසඳුම් ලබාදීම.

XIII. ගනුදෙනුකාර සේවාවන් සම්පාදනයේ දී පැන නගින නොයෙකුත් ගැටළු සහ විවිධ සංකීර්ණතා පිළිබඳව බැංකු නිලධාරීන් විසින් සිය ගනුදෙනුකරුට විචක්ෂණශීලී ව උපදෙස් ලබා දීම.

ඔබ සමුපකාර සමිතියේ/ සංගමයේ නිලධාරීන් සඳහා ඔවුන්ගේ සේවාවන් පිළිබඳ ගනුදෙනුකාර සම්මන්ත්‍රණ, පුහුණු සැසි පැවැත්වීම තුළින් ගනුදෙනුකරුවන් වෙත මූල්‍ය නොවන සේවාවන් සම්පාදනයට කටයුතු කිරීම සිදුකල යුතු අතර ඒ සඳහා මෙම නියාමන උපදෙස් අනුව කටයුතු කරන මෙන් අවධාරණය කරමි.



සුවින්ද එස්. සිංගප්පුලි,

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ

සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්